38

# මහනුවර යුගයේ ලංකාවේ සංගීතය

*පී. එච්. ඩී. දයාපතිරණ* [1]
HS/2013/0131

ලාංකේය සංගීතයේ ඉතිහාසය සම්බන්ධ ව මහනුවර යුගය වැදගත් වන ආකාරය විග්‍රහ කිරීම මෙම පර්යේෂණයේ මූලික අභිමතාර්ථය වේ. මහනුවර යුගය සම්බන්ධයෙන් පළ වී ඇති ලිඛිත මූලාශ්‍ර, ක්ෂේත්‍ර ගවේෂණය මඟින් ලබා ගන්නා ලද දත්ත ඉහත අරමුණ විශ්ලේෂණයට උපයෝගී කර ගැනීමට අපේක්ෂිත ය. මහනුවර යුගයේ සංගීතය පිළිබඳ ව විමසීමේ දී රාජ සභා සංගීතය වැදගත් වේ. රාජ සභාව සම්බන්ධ ව ප්‍රධාන ආයතන 5 ක් පිළිබඳ විග්‍රහ කිරීමට අපේක්ෂා කෙරේ. මෙකල රචිත පොතපතින් උපුටා දැක්විය හැකි ගීත බොහෝමයක් රාජ සභා සංගීතයට අදාළ වන අතර ඒ පිළිබඳ පැහැදිලි සටහන් මෙන් ම වාර්තා ද දක්නට ලැබේ. එහිදී රාජ සභා සංගීතය තුළ දකුණු ඉන්දීය සංගීතයේ බලපෑම ද දක්නට ලැබේ. වන්නම්, ප්‍රශස්ති, හටන්, විරහ කවි, සව්දම්, රාගම් ආදි වැදගත් සංගීතමය අංග ද, යුධ හරඹ, ඉන්ද්‍රජාල ,පිහිනුම් අංග ද, ශෘංගාර මණ්ඩප, නාටක ශාලා ආදියෙහි සංගීතමය හා නර්තනමය අංගයන් ද පවත්වා ඇත. මෙකල රචනා කොට තිබූ ඇතැම් පොතපතෙහි සඳහන් ආකාරයට නිශ්චිත ව ම මහනුවර යුගයේ පැවැතියේ කෙබඳු සංගීතයක් දැයි සනාථ කොට ගැනීමට නොහැකි ය. ඇසල උත්සවය, කාර්තික් උත්සවය, නානුමුර, සක්පංච, වඩ්ඩාරු ආදී වාදනයන් ද, දළදා සිංදුව, බුදුගුණ සිංදුව ලෙස නම් ලත් ගීත ද, රාග, තාල, ගීත, ලීලා, තාලම්, නාට්‍ය, සුරල් ආදිය ද මෙහි ලා වැදගත් වේ. මේ අනුව ලාංකේය සංගීත ඉතිහාසය සම්බන්ධ ව මහනුවර යුගය වැදගත් වන ආකාරය ඉහත සඳහන් කළ කරුණු ඔස්සේ විග්‍රහ කිරීමට නියමිත ය.

ප්‍රමුඛ පද : ලාංකේය සංගීතය, මහනුවර යුගය, රාජ සභා සංගීතය, දකුණු ඉන්දීය සංගීතය

1 ප්‍රාසංගික කලා (විශේෂවේදී) දෙවන වසර darshanidayapathirana@gmail.com